# 7 මුල් කිතුනු සභාව



7.1 රූපය - මරිය තුමිය හා ශ්‍රාවක පිරිස වෙත ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආගමනය

## පෙන්තකොස්තය (ක්‍රියා 2:1-13)

පාස්කුවෙන් පසු ජුදෙ ආගමිකයන්ගේ ප්‍රධාන මංගල්‍යය වූයේ 'පණහ' යන අරුත ඇති "පෙන්තකොස්ත" මංගල්‍යය යි. මෙය දෙවියන් වහන්සේට තුති දීමේ මංගල්‍යයකි. මෙම මංගල්‍යයේ දී ජුදෙව්වෝ තිරිඟු අස්වැන්න නෙළා, නැඹුල් එල ඔප්පු කරමින්, දෙවියන් වහන්සේට තුති පිදූ අතර ඔවුන්ට සීනයි කඳු මුදුනේ දී දස පනත ලැබීම ද සිහිපත් කළහ. මෙම මංගල්‍යයට සහභාගි වීමට විවිධ ප්‍රදේශවල සිටි ජුදෙව්වරු ජෙරුසලම් දේව මාළිගයට වන්දනා ගමන් ගියහ.

ජේසුස් වහන්සේ මෙලොවින් සමු ගැනීමට පෙර ඔවුන් වහන්සේගෙන් පසු ශුද්ධාත්මයාණන් වහන්සේ එවීමට පොරොන්දු වූ සේක. එය බලාපොරොත්තුවෙන් මරිය තුමිය ඇතුළු ශ්‍රාවක පිරිස ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයේ සිට දින 10ක් යාච්ඤා කරමින් කල් ගත කළහ. පෙන්තකොස්ත දිනයේ දී මෙලෙස යාච්ඤා කරමින් සිටින තැනට "සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක් හදිසියේ පැමිණියේ ය. ගිනි දළු වැනි දිව් බෙදී ගොස් ඔවුහු එකිනෙකා මත පිහිටිය හ" (ක්‍රියා 2:1-8). එයින් සංකේතවත් කළේ ජේසුස් වහන්සේ එවීමට පොරොන්දු වූ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආගමනය යි. ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ ශ්‍රාවකයන්, ආත්මයාණන් ඔවුන්ට දුන් කථා ශක්තිය අනුව අන්‍ය භාෂා කථා කරන්නට පටන් ගත්හ. මේ අවස්ථාවේ දී ප්‍රබල ව ශ්‍රාවකයින්ගේ ජීවිත වෙනස් වන්නට විය. එඩිතර වී දේව වචනයේ සාක්ෂිකරුවෝ වූහ.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## පෙන්තකොස්ත දින පේදුරු තුමාගේ දේශනාව හා එහි ප්‍රතිඵල (ක්‍රියා 2:14-41)

පෙන්තකොස්ත දින ජෙරුසලම් චතුරස්‍රයේ දී පේදුරු තුමා අන්‍ය භාෂා කථා කරනු අසා, සියල්ලෝ පුදුමයට පත් වූහ. මන්ද ඔහු නූගත් යැයි සම්මත වූ ගලීල වැසියකු වූ බැවිනි. එනමුත් මෙදින ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ අපෝස්තුලුවරු පරිණත කිතුනුවන් ලෙස නිර්භීත ව තම දූත සේවාව ආරම්භ කළෝ ය. පෙන්තකොස්ත දිනයේ පේදුරු තුමා තම කථාවෙන් නිර්භය ව ප්‍රකාශ කළේ ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ පුත්‍රයා බවත් ඉශ්‍රායෙල් ජනතාව ජේසුස් වහන්සේ ව කුරුසපත් කළ නමුත්, දෙවියන් වහන්සේ ඔවුන් වහන්සේ ව උත්ථාන කළ බවත් දෙවියන් වහන්සේගේ දකුණු පසෙහි ජේසුස් වහන්සේ වැඩ සිටින බවත් ය.

පේදුරු තුමාගේ මේ ඉදිරිපත් වීම අද සමාජයේ ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමට පසුබට වන අයට මහත් අභියෝගයකි. ශුද්ධාත්ම වරම් ලැබූ තැනැත්තකු හමුදා භටයකුට සමාන කළ හැකි ය. හමුදා භටයා මනා සූදානමකින් හා පුහුණුවකින් යුතු ව ආයුධවලින් සන්නද්ධ වී සිටින්නා සේ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ කිතුනුවා ද විශ්වාසයට එරෙහි ව පැමිණෙන අභියෝග ජය ගැනීමට මනා සූදානමකින් හා ආයුධ සන්නද්ධ ව සිටිය යුතු ය.

පේදුරු තුමාගේ දේශනයෙන් පසු මනස්ථාපනය වී බෞතිස්මය ලැබූ ගණන 3000ක් පමණ විය. එබැවින් "පෙන්තකොස්ත දිනය" ශු. සභාවේ උපන් දිනය ලෙස දක්වේ. ශුද්ධාත්ම මෙහෙය වීමෙන් පේදුරු තුමා ඉතාලි භට හමුදාවේ ශතාධිපතියෙකු වූ විජාතික කොර්නේලියස් ඇතුළු පවුලේ අයට ජේසුස් වහන්සේ පිළිබඳ සුබ අස්න දේශනා කළේ ය. ඔව්හු අදහා ගෙන බෞතිස්මය ලැබුවෝ ය (ක්‍රියා 10:1-8, 44-48).

## මුල් කිතුනු සභාවේ ලක්ෂණ (ක්‍රියා 2:42-47, ක්‍රියා 4:32-37)

මේ අයුරින් ශුද්ධාත්මයාණන් වහන්සේ කරණ කොට ගෙන වැඩි වර්ධනය වූ මුල් කිතුනු සභාවේ පහත සුවිශේෂී ලක්ෂණ තිබිණි.

1. ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම
2. සහභාගිකම
3. රොටී කැඩීම (දිව්‍ය පූජාව)
4. යාච්ඤාව

මෙම ලක්ෂණ නිසා ශු. සභාවට එකතු වන පිරිස තවත් වැඩි වර්ධනය විය. මේ අතරතුර මුල් කිතුනු සභාවේ "සහනාධාර බෙදීම" සම්බන්ධයෙන් ගැටලුවක් උද්ගත විය. එය නිරාකරණය කිරීමට "උපස්ථායකයන්" පත්කිරීම ඉතාමත් කාලෝචිත වූ අතර (ක්‍රියා 6:1-7) ඔවුන් පහත සඳහන් ගුණාංගවලින් යුක්ත විය.

- යහපත් දිවි පෙවෙතක් ගත කිරීම
- ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම
- ප්‍රඥාවෙන් පූර්ණ වීම.

ඔවුන් මත අත් තබා යාච්ඤා කිරීමෙන් අපෝස්තුලුවරු ඔවුන්ට වගකීම් පැවරූහ. විශේෂයෙන් සහනාධාර බෙදීම උපස්ථායකයනට පවරා අපෝස්තුලුවරු සුබ අස්න දෙසීම බාධාවකින් තොර ව කළෝ ය.

## ශුද්ධ වූ ස්තේපන් තුමාගේ සාක්ෂිය (ක්‍රියා 6:8-15, ක්‍රියා 7:54-60)

ශුද්ධ වූ ස්තේපන් තුමා උපස්ථාදායකයකු ලෙස කටයුතු කළා පමණක් නොව සුබ අස්න ද දේශනා කළේ ය. එතුමාට ගල් ගසා මරා දැමූ අතර එතුමා ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා ය.

## ශුද්ධ වූ මහා ජාකොබ් තුමා (ක්‍රියා 12:1-2)

අපෝස්තුලුවරුන් දොළොස්දෙනා අතරින් පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා වන්නේ ශු. මහා ජාකොබ් හෙවත් සන්තියාගෝ මුනිතුමා ය. හෙරොද් (අග්‍රිපා i) විසින් ඔහු ව හිස ගසා මරා දමන ලදි.

මෙලෙස ඔවුනට ප්‍රාණපරිත්‍යාගි වීමට ශක්තිය ලැබුණේ ඔවුන් ශුද්ධාත්ම වරමින් පූර්ණ වී පරිණත කිතුනුවන් ලෙස, සැබෑ ක්‍රිස්තු සෙබලුන් වූ නිසා ය. අභිවෘද්ධි ආලේපය ලබන අවස්ථාවේ දී අප ද එලෙස ම ශුද්ධාත්ම වරමින් පූර්ණ කර ඇත්තේ අභියෝග හමුවේ විශ්වාසයට සාක්ෂි දැරීමට ය.

### ක්‍රියාකාරකම

1. පේදුරු තුමාගේ ප්‍රථම දේශනයේ අඩංගු කරුණු **තුනක්** ලියන්න.
2. ශුද්ධාත්ම ආගමන දිනයේ දී සිදු වූ විශේෂතා පිළිවෙළින් ලියන්න.
3. "පෙන්තකොස්ත" යන වචනයේ අර්ථය ලියන්න.
4. මුල් ක්‍රිස්තියානි සභාවේ ලක්ෂණ වගු ගත කරන්න.
5. අපෝස්තුලුවරු උපස්ථායකයන් පත් කළේ ඇයි?
6. ශුද්ධාත්ම බලය ලැබූ ඔබ විශ්වාසය වෙනුවෙන් සාක්ෂි දැරූ අවස්ථාවක් ලියන්න.

*ජීවිතය සඳහා*

★ *ක්‍රිස්තුන් වහන්සේගේ සේනා භටයින් ලෙස, ලෝකයා ඉදිරියේ ඔවුන් වහන්සේට සාක්ෂි දරමු.*

★ *පරාර්ථකාමී ව ජනයාගේ සුබ සිද්ධිය උදෙසා වැඩ කරමු.*

★ *අප සතු ව ඇති දේවල් නැති බැරි අය සමග බෙදා ගනිමු.*